5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය - 2026

"නැණ අභිමන්" පෙරහුරු ප්‍රශ්න පත්‍රය අංක


දෙනුවර අධ්‍යාපන කලාපය

I පත්‍රය

නම..... පැය 01 යි මිනිත්තු

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

(01)පහත රූපය නිරීක්ෂණය කර නිවැරදි ප්‍රකාශය තෝරන්න




1. ළමයි හත් දෙනෙක් දිවීමේ තරගයක යෙදී සිටිති.

2.තරග ජයග්‍රාහකයෝ සහතිකපත් ලබා ගනිති.

3.ළමයි තිදෙනෙක් බංකු මතින් පැන දුවති.


(02) පහත කොටු තුළ ඇති රූප වල වැඩිපුරම සිටින්නේ




(1) මාංශ භක්ෂක සතුන් ය. (2) ශාක භක්ෂක සතුන් ය. (3) සිවුපා සතුන් ය.


(03) අවිනි ඡායා රූපයක් පෙන්වා මෙසේ කීවා ය. " මේ ඡායා රූපයේ සිටින තැනැත්තියගේ පියා මගේ අම්මාගේ ද පියා ය." එසේ නම් මෙම ඡායා රූපයේ සිටින කාන්තාව නැකමින් අවිනිගේ කවු ද ?


(1) ලොකු නැන්දා (2) ආච්චි අම්මා (3) ලොකු අම්මා

(04) 


රූපයේ දක්වා ඇති කාඩ් බෝඩ් පෙට්ටිය සෑදීමට භාවිතා කර ඇති කාඩ් බෝඩ් කැබැල්ල තෝරන්න

(1) 


(2) 

(3) 

(05) පහත දක්වා ඇත්තේ බටු පැළ සිටුවීම සඳහා පාත්තියක් සකස් කර ඇති ආකාරය යි. එහි එක් රේඛාවක බටු පැළ 9 ය බැගින් සිටුවා ඇත් නම් පාත්තියේ ඇති මුළු බටු පැළ ගණන කීය ද ?



(1) 41 (2) 33 (3) 72

(06) 

යන සංකේත යොදාගෙන බලතල යන වචනය ලියා තිබුණි.

ඒ අනුව  යන සංකේත මගින් අදහස් කරන වචනය කුමක් ද ?

(1) තලප (2) බලන (3) බතල

(07) ළමයෙකු ගමනක් යන විට ඉර අව්ව වැටී ගසක සෙවනැල්ල දක්නට ලැබුණු ආකාරය පහත රූප සටහනේ දැක්වේ. ඒ අනුව ඔහු ගමන් කරන වේලාව විය හැක්කේ,






(1) පෙ.ව . - 8 . 00

(2) දහවල් - 12 . 00

(3) ප.ව. - 4 . 00

(08)  සංකේතය දෙවරක් ද  සංකේතය එක් වරක් ද යොදාගෙන 664 යන සංඛ්‍යාව ලියා තිබුණි. 664 ට 100 ක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාව දැක්වෙන පිළිතුර වන්නේ ,

(1)  (2)  (3) 

(09) මෙම ගසෙහි "A" ස්ථානයෙහි කුඩුව සෑදිය හැකි පක්ෂියෙකු වන්නේ ,





(01) උකුස්සා (02) මොනරා (03) කිරලා

(10) නෙතුකි , නෙතුනි , ඕෂධී , රෙතුලි , ආකර්ෂා හා විහාදි යන හය දෙනා අතුරින් නෙතුකිට වඩා වයසින් බාල සිව් දෙනෙකු පමණි. නෙතුනිට වඩා වයසින් බාල තිදෙනෙකු පමණි. ආකරෂාට වඩා ඒයසින් බාල දෙදෙනෙකු පමණි. විහාදිට වඩා වයසින් බාල ඕෂධී පමණි. මේ අනුව වයසින් අඩුම තැනැත්තිය හා වයසින් වැඩිම තැනැත්තිය තෝරන්න

(1) ඕෂධී හා රෙතුලි (2) රෙතුලි හා ඕෂධී (3) නෙතුකි හා නෙතුනි


(11) වත්තක ඇති අඹ ගස් සංඛ්‍යාව පේර ගස් සංඛ්‍යාව මෙන් තුන් ගුණයකි.එහි ඇති පොල් ගස් ගණන අඹ හා පේර ගස් සංඛ්‍යාවේ එකතුවට සමාන ය. එම තොරතුර ප්‍රමාණාත්මකව දක්වා ඇති පිළිතුර තෝරන්න.


(1) 


(2) 


(3) 

(12) ළමයෙකු ගණිතය පාඩමක් සඳහා අඳින ලද රූප සටහනක් පහත දැක්වේ. එය වට බාගයක් ඔරලෝසුවේ කටු ගමන් කරන දිශාවට කරකැවූ විට දැක ගත හැකි ආකාරය වන්නේ,



(1) 

(2) 

(3) 


(13) පහත කවිය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නයට පිළිතුරු සපයන්න

රන්වන් බිජු පල - මුල් ඇද ගන්නේ
දලු කොළ දෙක තුන - හෙමිහිට එන්නේ
පස සරු කොට අප - එය සිටුවන්නේ
රන් වන් රන් අප - ගෙවතු කරන්නේ

මෙම කවියෙන් කියවෙන්නේ ,

(1) කුඹුරු වගාවක් ගැන (2) හේන් වගාවක් ගැන (3) ගෙවතු වගාවක් ගැන

(14) පහත රූපයේ දැක්වෙන තරාදිය සමබරව පවතී. ඒ අනුව ● ● බරට සමාන වනුයේ,



(1) ▲ ▲

(2) ▲

(3) ■


(15) පන්තියක සිටින ගැහැනු ළමයි ගණන 11 වන අතර පිරිමි ළමයි ගණන ගැහැනු ළමයි ගණනට වඩා තුන්ගුණයකින් වැඩිය. ඒ අනුව එම පන්තියේ සිටින ශිෂ්‍ය සසංඛ්‍යාව කොපමණ ද,

(1) 20 (2) 44 (3) 30

(16) පෝළිමක පිරිමි ළමුන් දෙදෙනෙකු අතරට ගැහැනු ළමුන් සිව්දෙනෙකු වන සේ ළමුන් 180 දෙනෙක් කණ්ඩායම් කර ඇත. එම කණ්ඩායමේ සිටින පිරිමි ළමුන් ගණන හා ගැහැනු ළමුන් ගණන පිළිවෙළින් දැක්වෙනුයේ,

(1) 60 , 120 (2) 120 , 60 (3) 100 , 80

- රූපයේ දැක්වෙන්නේ සෑම පැත්තකින්ම තීන්ත ආලේප කර ඇති ඝන ලී කුට්ටියකි. එය කඩ ඉරි දිගේ කපා කුඩා ලී කුට්ටි සමූහයක් ලබා ගන්නා ලදි. ඒ ඇසුරෙන් අංක 17 හා 18 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න



(17) කඩ ඉරි දිගේ කැපීමෙන් කුඩා ලී කුට්ටි කීයක් ලැබේ ද ?

(1) 32 (2) 48 (3) 64

(18) කුඩා ඝනකවල එක් මුහුණතක පමණක් සහ මුහුණත් තුනක තීන්ත ගෑවුණු ඝනක සංඛ්‍යාව පිළිවෙළින් දැක්වෙන්නේ,

(1) 24 , 8 (2) 6 , 8 (3) 6 , 6

(19) අඹ ගසක කුරුල්ලෝ පස් දෙනෙක් ද රඹුටන් ගසක කුරුල්ලෝ හත් දෙනෙක් ද සිටිති. අඹ ගසේ සිටි කුරුල්ලෝ තුන් දෙනෙක් රඹුටන් ගසට ඉගිල ගිය අතර රඹුටන් ගසේ සිටි කුරුල්ලෝ හතර දෙනෙක් අඹ ගසට ඉගිල ආහ.දැන් අඹ ගසේ සිටින කුරුල්ලන් ගණන රඹුටන් ගසේ සිටින කුරුල්ලන් ගණනට,

(1) වඩා අඩුය (2) වඩා වැඩිය (3) සමානය

(20) කුඩා පොතක 8 වන පිටු අංකයට පසුව නැවත දිස් වූයේ 15 වන පිටු අංකය වන අතර ඒ අතර මැද කොළ කැඩී ඉවත් වී තිබුණි. එසේ ඉවත් වූ කොළ ගණන විය හැක්කේ,

(1) 3 (2) 6 (3) 7


(21) පන්ති කාමරයක සිටි ගැහැනු ළමයි සංඛ්‍යාව එහි සිටි පිරිමි ළමයි සංඛ්‍යාව මෙන් හතර ගුණයකි. එම පන්තියේ සිටි ගැහැනු ළමයි සංඛ්‍යාවෙන් පිරිමි ළමයි සංඛ්‍යාවේන් එකතුව කීය ද?

(1) 24 (2) 25 (3) 26


(22) උදෑසන ක්‍රීඩා පිටියට ගිය දේනුක A සිට B සිට දිවයන විට ඔහුගේ සෙවනැල්ල වැටී තිබුණේ ඔහුගේ වම් අත පැත්තට ය.

දේනුක B සිට C දෙසට දිවයන විට සෙවනැල්ල වැටී තිබුණේ ඔහුගේ,

(1) දකුණු පසිනි (2) ඉදිරි පසිනි (3) පිටු පසිනි



(23) රූපයේ දැක්වෙන්නේ වෘත්තාකාර ධාවන පථයකි




අකිඳු සහ හසිඳු මෙම ධාවන පථයේ දිවීමේ තරගයකට සහභාගී වූහ. එහි දී A ස්ථානයෙන් ගමන් අරඹා ඊතලයෙන් පෙන්වන දිශාවට දිවීමේ දී හසිඳු B ස්ථානයට ළඟා වන විට අකිඳු සිටියේ C ස්ථානයේ නම් හසිඳු නැවත A ස්ථානයට ළඟා වනවිට අකිඳු සිටිය හැකි ස්ථානය වන්නේ,

(1) A (2) B (3) C

(23) එක් ගෙඩියක් කෑලි 10 කට කැපූ කොමඩු ගෙඩි දෙකක් ද එක් ගෙඩියක් කෑලි 4 කට කැපූ ඇපල් ගෙඩි පහක් ද එක් ගෙඩියක් කෑලි 2 කට කැපූ පේර ගෙඩි දහයක් ද සෑම ළමයෙකුට ම සෑම වර්ගයකින්ම එක් කැබැල්ල බැගින් සමානව බෙදුවේ නම් එහි සිටිය හැකි ළමයි ගණන විය හැක්කේ,

(1) 10 (2) 20 (3) 30

(24) මෙම රූපයේ ඇති සෘජුකෝණාස්‍ර සහිත ත්‍රිකෝණ ගණන වන්නේ,



(1) 3

(2) 4

(3) 5

(25) දී ඇති සංඛ්‍යා රටාවල හිස්තැනට සුදුසු සංඛ්‍යාව තෝරන්න

				3		2		3				
			2		5		5		2			
		2		....		10		7		2		
	2		9		17		17		....		2	
2		11		26		34		26		11		2

(1) 7 සහ 9 (2) 10 සහ 17 (3) 11 සහ 17

(26)


මකන හතරක මිල = පෑන් දෙකක මිල
පෑන් හතරක මිල = පොතක මිල

ඕෂධී මකන දෙකක් හා පෑන් හයක් ද තිසර පෑනක් හා පොත් දෙකක් ද සසිඳු පෑන් හයක් හා මකන හතරක් ද මිලට ගත් විට වැඩිම මුදලක් වැය වන්නේ කාට ද ?


(1) සසිඳුට (2) තිසරට (3) ඕෂධීට

(27) A රූපය තුළ B රූපයේ හැඩයේ විවිධ පිහිටීම් කීයක් දැකිය හැකි ද ?

A රූපය



B රූපය




(1) 4 කි


(2) 6 කි

(3) 3 කි


- අකුරු සඳහා පහත අයුරින් සංකේත ලබා දී ඇත. ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න




කසය



සරල



කමල



අලස

(28) සරම සඳහා පිළිවෙලින් ඇති අක්ෂර පේළිය වන්නේ,

(1) R T S (2) P R D (3) T D S

(29) කරල සඳහා පිළිවෙලින් ඇති අක්ෂර පේළිය වන්නේ,

(1) R D P (2) P R D (3) V W T

(30) කොළඹ සිට මහනුවර බලා ගමන් කළ බස් රථයක් නගර කිහිපයක් පසු කළ ආකාරය පහත දැක්වේ.

- කඩවත නගරය පසු කළේ නිට්ටඹුව නගරය පසු කිරීමට පෙරය. නිට්ටඹුව නගරය පසු කිරීමෙන් පසු කෑගල්ල නගරය පසු කරන ලද අතර කෑගල්ලත් මහනුවරත් අතර පේරාදෙණිය නගරය පිහිටා ඇත.


බස් රථය නුවර සිට කොළඹ බලා එම මාර් ගයේම පැමිණෙන විට එම නගර පසු කරන ලද අනුපිළිවෙල වන්නේ,

(1) කඩවත , නිට්ටඹුව , කෑගල්ල , පේරාදෙණිය

(2) නිට්ටඹුව , කඩවත , කෑගල්ල , පේරාදෙණිය

(3) පේරාදෙණිය , කෑගල්ල , නිට්ටඹුව , කඩවත

(31) පහත A භාජනය හා B භාජනය දෙපස විවෘතව ඇති බටයක් මගින් එකට සම්බන්ධ කර ඇත. ඒ අනුව C භාජනයේ ඇති ජල පරිමාව B භාජනයට දැමූ විට A හා B භාජනවල ඇති ජල පරිමාව පිළිවෙලින් දක්නට ලැබෙන පිළිතුර වන්නේ,



(1) 1 l හා 7 l (2) 2 l හා 5 l (3) 4 l හා 4 l


(32) ඉලක්කම් හතරක සංඛ්‍යාවකි.

- තුන්වන ඉලක්කම පළමු ඉලක්කමට වඩා දෙකකින් වැඩිය
- හතරවන ඉලක්කම දෙවන ඉලක්කම මෙන් තුන් ගුණයකි.

ඒ අනුව නිවැරදි සංඛ්‍යාව විය හැක්කේ,

(1) 2349 (2) 4963 (3) 5376

(33) නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න








මෙම රූපයේ උස වන්නේ

(1) 35 m (2) 40 m (3) 45 m

(34) කම්බි කැබැල්ලක් හරි මැදින් දෙකට නවා නැවතත් හරි මැදින් දෙකට නවා ඇත. එසේ නවා ගත් කම්බි කැබැල්ල හරි මැදින් දෙකට කැපුවේ නම් ලැබෙන කම්බි කැබලි ගණන කීය ද ? (1) 4 (2) 5 (3) 8

(35) එක්තරා පාසලක ක්‍රිකට් ක්‍රීඩකයින් ද පාපන්දු ක්‍රීඩකයින් ද සිටින අතර එම ක්‍රීඩාවන් දෙකේම නියැළෙන පිරිසක් ද සිටිති. එම පාසලේ වෙස් ක්‍රීඩාවේ පමණක් යෙදෙන පිරිසක් ද සිටින අතර ඔවුහු වෙනත් ක්‍රීඩාවක නොයෙදෙති.මෙම අදහස නිරූපණය වන රූප සටහන තෝරන්න

(1)  (2)  (3) 

(36) අවුරුදු උත්සවයක සංගීත පුටු තරගයක් පැවැත්වීම සඳහා රවුමට පුටු තබා ඇත. පස්වන පුටුවට ඉදිරියෙන් ඇත්තේ පහළොස්වන පුටුව නම් එහි තබා තිබූ මුළු පුටු ගණන කීය ද ?

(1) 20 (2) 28 (3) 30

(37) ප්‍රදර්ශනයක් නැරඹීම සඳහා පැමිණෙන සෑම අයෙකුටම ටිකට් පතක් නිකුත් කෙරේ. දවස ආරම්භයේ නිකුත් කළ ටිකට් පතෙහි අංකය 0100 විය. එදින නිකුත් කළ අවසාන ටිකට් පතෙහි අංකය 0200 නම් එදින ප්‍රදරශනය නැරඹීම සඳහා පැමිණි මුළු පිරිස කොපමණ ද ?

(1) 99 (2) 100 (3) 101

(38) යම් කිසි සංඛ්‍යාවක් 7 න් ගුණ කිරීම සඳහා දී ඇත. නමුත් නිමල් එය 9 න් ගුණ කිරීමක් ලෙස සිතා පිළිතුර ලබාගෙන ඇත. එවිට අපේක්ෂා කළ පිළිතුරට වඩා සංඛ්‍යාව 16 කින් වැඩි වී තිබුණි. නිමල් 7 න් ගුණ කළ යුතුව තිබූ සංඛ්‍යාව කීය ද ?

(1) 7 (2) 8 (3) 9

(39) සහල් පිටි කිලෝ ග්‍රෑම් එකකින් කැවුම් ගෙඩි 50 ක් සහ කොකිස් 30 ක් සෑදිය හැකිය. කැවුම් ගෙඩි 25 ක් සහ කොකිස් 15 ක් සඳහා අවශ්‍යවන පිටි ප්‍රමාණය කොපමණද?

(1) ග්‍රෑම් 500 (2) ග්‍රෑම් 750 (3) කිලෝ ග්‍රෑම් 1

(40) ප්‍රශ්න 25 කින් සමන්විත ප්‍රශ්න පත්‍රයක් ඇත. සෑම නිවැරදි පිළිතුරකටම ලකුණු 5 ක් හිමිවන අතර සෑම වැරදි පිළිතුරක් සඳහාම උපයාගත් ලකුණු වලින් 2 ක් බැගින් අඩු වේ. ප්‍රශ්න 25 සඳහා අනිවාරයෙන්ම පිළිතුරු සැපයිය යුතුය. ප්‍රශ්න 15 කට නිවැරදි පිළිතුර සැපයූ අයෙකුට අවසානයේ ලැබෙන ලකුණු ප්‍රමාණය කොපමණ ද

(1) 50 (2) 55 (3) 7 (2 . 5 × 40 = 100)

5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය - 2026

“නැණ අභිමන්” පෙරහුරු ප්‍රශ්න පත්‍රය අංක

දෙනුවර අධ්‍යාපන කලාපය

ii පත්‍රය

නම..... පැය 01 යි මිනිත්තු 15

- පහත දැක්වෙන ඡේදය කියවන්න

ශ්‍රී ලංකාවේ වනෝද්‍යාන අතුරෙන් විල්පත්තු ජාතික වනෝද්‍යානය විශේෂ තැනක් ගනී.විල්ලුවලින් ගහන වූ ප්‍රදේශයක් නිසා මෙම උද්‍යානය “ විල්පත්තුව” නමින් හඳුන්වයි. මෙම වනෝද්‍යානය තුළ ශ්‍රී ලංකාවට ආවේණික ශාක විශේෂ නිස් තුනක් ක් පමණ දැකිය හැකිය. ශ්‍රී ලංකා කළු වඳුරා , මී මින්නා වැනි ක්ෂීරපායීන් ද මුහුදු නයා, පොළොන් තෙළිස්සා , තෙල් කරවලා වැනි සර්ප විශේෂ ද මේ වනෝද්‍යානය තුළ දැකිය හැකි ශ්‍රී ලංකාවට ආවේණික සතුන් අතර වෙයි.

ශ්‍රී ලංකාවේ විශාල ම උරග විශේෂයක් වන පිඹුරා මෙහි දක්නට ලැබේ. මෙම වනෝද්‍යානය වයඹ හා උතුරු මැද පළාත්වලට අයත් වේ.

- ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න

i. මෙම වනෝද්‍යානය “ විල්පත්තුව” නමින් හඳුන්වන්නේ ඇයි ? .....

.....

ii.මෙහි ශ්‍රී ලංකාවට ආවේණික ශාක විශේෂ කීයක් තිබේ ද ? .....

iii. මෙහි සිටින ශ්‍රී ලංකාවට ආවේණික ක්ෂීරපායී සතෙකු නම් කරන්න .....

.....

iv. මෙම වනෝද්‍යානය පැතිර ඇති පළාත් මොනවා ද? .....

.....

v. මෙහි සඳහන් “ පිඹුරා ”අයත් සත්ත්ව විශේෂය කුමක් ද?

.....

vi. “ කිරි බී වැඩෙන සතුන් ” හැඳින්වීමට මෙහි යොදා ඇති වචනය කුමක් ද?

.....

(2) පහත දැක්වෙන වචන ගළපා අර්ථවත් කවි පදයක් නිර්මාණය කරන්න

බිමට / බණ්ඩි / කිරට / ඇදී / කරල් / නැමෙනවා ය / හැරී

.....

(3) පහත සඳහන් එක් එක් වාක්‍යයේ හිස්තැනට ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා ලියන්න

i. ..... (මා / මම) තවම ලංකාව නොදුටුවෙමි.

ii. ගුරුතුමිය ..... (සිසුන් / සිසුහු) සමඟ පිටිටනියට ගියා ය.

iii. රුවල් ඔරු මුහුදේ ..... (පාවෙයි / පාවෙති)

iv..... (ගායකයන් / ගායකයෝ) ගීත ගයති.

(4) ගැළපෙන විරාම ලකුණු යොදන්න

අයියේ සීනි බෝල ගෙනාවාද ඈ මහ ගෙදර යන විට අසනු ඇත.

(5) පහත ප්‍රස්ථාවපිරුළු සම්පූර්ණ කරන්න

i. කැකිල්ලේ රජ්ජුරුවන්ගේ .....වගේ

ii.ගඟ ..... වගේ

(6) පහත සඳහන් එක් එක් වාක්‍යයෙහි නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න

I. ගොවියා (පැල / පැළ) තුළට වී සී පද කියයි.

ii.(මොනරා / මොණරා) පිල් විදහා නැටුවේ ය.

(7) පහත දැක්වෙන එක් එක් වැකියේ යටින් ඉරක් ඇඳ ඇති වචනයට ගැළපෙන සමානාර්ථ පදය බැගින් ලියන්න

i. ඉසුරුමුණිය ගල් කැටයම් සඳහා <u>ප්‍රසිද්ධ</u> වේ. .....

ii.නැව <u>වතුරේ</u> පා වුණේ ය. .....

iii. සූර්යයා <u>අහසේ</u> දීප්තිමත් ව බබළ යි. .....

(8) පහත වර්තමාන කාල වැකි අතීත කාලයට හරවන්න

i. ඈ දිවුල් ඇඟිදීමට වත්ත පහළට දිව යයි. .....


ii.උෂ මලින් මලට පියඹා පැණි බොයි. .....


iii. ඔවුහු පිටිටනියේ සෙල්ලම් කරති. .....

(9) එක් එක් ඉංග්‍රීසි වචනය සඳහා යෙදෙන සිංහල වචනය බැගින් ලියන්න

i. National Tree - ..... ii.Fruits - .....

(10) පහත රූපවලට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරින් ලියන්න





....


(11) පහත සඳහන් දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න

i. තාත්තා - ..... ii. කළුවුංගල් - .....

(12) පහත සඳහන් වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න

උංගලුක්කු තණ්ණීර් වේණ්ඩුමා - .....

(13) ගණක රාමුවේ නිරූපිත සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න



.....


(14) පහත දී ඇති සංඛ්‍යාව අකුරෙන් ලියන්න

30 475 - .....

(15) පහත දැක්වෙන සංඛ්‍යා අවරෝහණ ක්‍රමයට ලියන්න

4 575 , 4 202 , 4 300 , 4 405 - .....

(16) පහත රූපයේ අඳුරු කර ඇති කොටස භාග සංඛ්‍යාවක් ලෙස ලියන්න



.....

(17) රථ ගාලක ත්‍රී රෝද රථ 15 ක් ද මෝටර් රථ 25 ක් ද ඇත. ඒවායේ ඇති මුළු රෝද ගණන කීය ද ? .....

(18) චිත්‍රපටයක් පෙ. ව. 9 .20 ට ආරම්භ වී ප. ව. 1 . 30 ට අවසන් විය. චිත්‍ර පටය විකාශය වූ කාලය කොපමණ ද ? .....

(19) වෙළෙන්දෙකු පොළට ගෙනෙන ලද තක්කාලි ගෝනියක බර කිලෝ ග්‍රෑම් 38 විය. ඉන් තක්කාලි කිලෝ ග්‍රෑම් 29 ග්‍රෑම් 750 ක් විකුණූ පසු ඉතිරි වූ තක්කාලි ප්‍රමාණය කොපමණ ද ? .....

(20) සමතල මුහුනත් දෙකක් සහිත ඝනවස්තුව කුමක් ද ? .....

(21) පහත දැක්වෙන්නේ නගර තුනක පිහිටීම දැක්වෙන දළ සටහනකි.

A B C


මෙහි A සිට B නගරයට ඇති දුර 2 km 550 m කි. B හා C නගර අතර දුර එමෙන් තුන් ගුණයකි. A සිට C දක්වා ඇති නගර අතර මුළු දුර කොපමණ ද ? .....

(22) මකන කෑලි 6 බැගින් ඇති පෙට්ටි 127 ක් රාක්කයක අසුරා ඇත. එහි ඇති මුළු මකන කෑලි ගණන කොපමණ ද ? .....

(23) බේසමකට දැමිය හැකි ජල ප්‍රමාණය ලීටර 13 මිලි ලීටර 650 කි. ඉන් ලීටර 6 මිලි ලීටර 725 ක් භාවිතයට ගන්නා ලදි. බේසමේ ඉතිරි ජල ප්‍රමාණය කොපමණ ද ? .....

.....

(24) පහත දැක්වෙන සටහන අනුව දී ඇති වගන්තියේ හිස් තැනට ආයුතු වචනය ලියන්න



බසය ඇත්තේ ගසට

..... දිශාවෙනි

(25) ගොවි පොළක සිටින සතුන් ප්‍රමාණය පහත දැක්වේ. ඒ ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

සතුන් වර්ගය	ගවයෝ	කුකුළෝ	එළුවෝ
ප්‍රමාණය	3 604	5 450	2 675

I. ගවයන්ට වඩා කුකුළෝ කොපමණ ප්‍රමාණයක් වැඩිපුර සිටී ද ? .....

II. කුකුළන් හැර ගොවිපොළේ සිටින අනෙකුත් සතුන් ප්‍රමාණය කොපමණ ද ? .....

(26) පහත දැක්වෙන මිල දර්ශනය ඇසුරෙන් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

ද්‍රව්‍ය	මිල	
	රුපියල්	සත
පොත	125	00
පාට පෙට්ටිය	260	50
පැන්සල් පෙට්ටිය	395	00

I. පොත් දෙකක් මිලදී ගත් අයෙකු ගෙවිය යුතු මුදල කීය ද ? .....

II. පොතක් හා පාට පෙට්ටියක් මිලදී ගෙන රු. 500.00 දුන් විට ලැබෙන ඉතිරි මුදල කොපමණ ද? .....

(27) දිවුල් ගොඩක ගෙඩි 228 ක් තිබුණි. ඉන් හතරෙන් පංගු තුනක් ඉදී තිබුණි. අමු දිවුල් ගෙඩි ගණන කීය ද ? .....

- ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න

(28) සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමේ තුන්වන පියවර වන්නේ,

1. ශාරීරික ලිහිල් බව 2. අධිෂ්ඨානය 3. මානසික ලිහිල් බව

(29) අලුදෙණියේ බණ්ඩා යනුවෙන් හඳුන්වන්නේ,

1. කැප්පෙටිපොළ නිළමේ තුමා 2. මොල්ලිගොඩ දිසාවේ
3. ගොංගාලේගොඩ බණ්ඩා

(30) "පිනවන දුටු දන සෑම" කවියෙන් කියවෙන්නේ

1. ඓතිහිසික සිද්ධස්ථානයක් ගැන 2. ඓතිහාසික ශාකයක් ගැන
3. ඓතිහාසික නගරයක් ගැන

(31) රාමසාන් උත්සවය පවත්වනු ලබන ආගමිකයන් වන්නේ ,

1. බෞද්ධ 2. හින්දු 3. ඉස්ලාම්

(32) දඩු සිටුවා පැළ ලබා ගන්නා ශාකයකි

1. කංකුං 2. වට්ටක්කා 4. මිරිස්

(33) සිතියම්වල ගංගා දැක්වීමට යොදාගන්නා වර්ණය වන්නේ

1. නිල් 2. කොළ 5. දුඹුරු

(34) වැල්වල සෑදෙන එළවළුවක් නොවන්නේ

1. බණ්ඩක්කා 2. පතෝල 3. කරවිල

(35) ජලයේ පාවෙන දෙයක් නොවන්නේ

1. රබර් බෝලය 2. මල 3. ගල් කැටය

(36) පැළ කිරීමට සුදුසු බීජයක ලක්ෂණයක් නොවන්නේ

1. හොඳින් මෝරා තිබීම 2. කෘමිහානි නොතිබීම 3. පළුදු සහිත වීම

(37) චුම්බකයක් තවත් චුම්බකයක් වෙත ඇදී යාම හඳුන්වන්නේ,

1. ආකර්ෂණය 2. ඝර්ෂණය 3. විකර්ෂණය

(38) කාල සටහන අනුව වැඩ කිරීමෙන් ලැබෙන වාසියකි

1. කාලය කළමනාකරණය කරගත හැකි වීම 2. අනවශ්‍ය වෙහෙසක් දැරීමට සිදුවීම
3. වැඩ අතපසුවීම

(39) පුන්කලස මගින් නිරූපණය වන්නේ

1. සෞභාග්‍ය හා පරිපූරණ බව 2. ස්වයං පෝෂිත බව 3. පිවිතුරු බව

(40) ඒක දේශීය ශාකයකි

1. ලේන් තැරි 2. පොල් 3. කොස්

(41) ලෝක උරුමයක් ලෙස නම් කර ඇති ස්ථානයකි

1. සීගිරිය 2. කැලණිය 3. යාපහුව

(42) දැති රෝද කට්ටලයක් සහිත උපකරණයකි

1. පා පැදිය 2. මාලිමාව 3. ශීතකරණය

(43) ශක්ති ජනක ආහාරවල බහුලවම අඩංගු පෝෂකය වන්නේ

1. කාබෝහයිඩ්‍රේට් 2. විටමින් හා ඛනිජ ලවණ 3. ප්‍රෝටීන් හා පිෂ්ටය

(44) ක්‍රීඩා පිටියක් තුළ දක්නට නොලැබෙන දෙයකි

1. විදුම් කණුව 2. පාපන්දු දැල 3. සර්පිනාව

(45) වැඩි පුර ජලය රඳවා තබා ගත හැක්කේ කිනම් පසක ද

1.වැලි සහිත පසක 2. මැටි සහිත පසක 3. බොරලු සහිත පසක

(46) පස තුළ සිටින, ගොවියාට උපකාර කරන සතෙකි

1. බිංකුණ්ඩා 2. දිමියා 3. ගැඩවිලා

(47) මින්නේරි දෙවියන් ලෙසින් හඳුන්වනු ලැබූ රජතුමා කවුද?

1. මහසෙන් රජු 2. වළගම්බා රජු 3. කාශ්‍යප රජු

(48) එක් වරක් පමණක් මල් හා ඵලදාව ලබා දීමෙන් පසුව විනාශවන ශාකයකි

1. මීවන 2. පතොක් 3. කෙසෙල්